WWW.ASKNETWORK.NET

Sinhala

දේශයන් උදෙසා ඉල්ලා සිටීම

ගීතාවලිය 2:8 හි දෙවියන්වහන්සේ “.....මාගෙන් අයැදින්න. සකල ජාතීහු නුඹ උරුමය වන්නෝය ....” යයි කියන විට, යේසුස්වහන්සේගේ අනුගාමිකයන් වශයෙන් අපට මෙම ආරාධනාවට ASK වෙත ප්‍රතිචාර දැක්විය හැකිවන්නේය.

ඉල්ලන්න, ඔබට දෙනු ලැබේ; සොයන්න, ඔබට සම්බ වේ;
තට්ටු කරන්න, ඔබට දොර අරිනු ලැබේ.
මතෙව් 7:7

දේශයන් උදෙසා ඉල්ලීම

ඉල්ලීමඉතාමත් වැදගත් වන්නේය. අප නිරන්තරයෙන්, දිගින් දිගටම සහ උවමනාවෙන් හිතාමතාම ඉල්ලුම් කළ යුතුය! අප යමක් **ඉල්ලූ** විට එය **ලබාදෙන** බව යේසුස්වහන්සේ කී සේක.

දේශයන් උදෙසා සොයමින්

මෙයින් අදහස් කරන්නේ අප වැඩියෙන් දැන ගැනීම අවශ්‍ය බවත්, අපගේ ඉල්ලීමේදී යොමුවෙමින් නිශ්චිත විය යුතු බවත්, අත්නොහැරිය යුතු බවත්ය. අප **සොයන** විට අපට **සම්බවෙන** බව යේසුස්වහන්සේ කී සේක.

දේශයන් උදෙසා තට්ටුකිරීම

අප ඉල්ලන විට අප කෙතරම් තදින්ම එසේ කරන්නේද, අප සැබවින්ම **තට්ටු කිරීමක්** කරන විට ඔනෑම විරෝධත්වයක් බිඳ දැමිය හැකිවන්නේය. යේසුස්වහන්සේ මෙය විස්තර කරන්නේ **විධෘත දෙරටුවක්** ලෙසය.

ඔබ දේශයන් උදෙසා කරන යාච්ඤා තුළින් සිදුවන්නට යන දේ පිළිබඳ දර්ශනයක් දෙන ලෙසට දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

ඉන්පසු සියලු ජාතීන්ගෙන්ද ගෝත්‍රවලින්ද ජනසමූහයාගෙන්ද භාෂාවන්ගෙන්ද කිසිවෙකුට ගණන් නොකළ හැකිතරම් ඉමහත් පිරිසක්, සුදු සළු පැළඳ, තালපත්‍ර අතින්ගෙන, සිංහාසනය හා බැටළු පෝතකයාණන් ඉදිරියෙහි සිටිනු මම දිටිමි. එළිදරව් 7:9

දේශයන් උදෙසා දෙවියන්වහන්සේගේ ප්‍රේමය සහ අනුකම්පාව ඔබට දෙන ලෙසට උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

දෙවියන්වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේමකළ සේක්ද කීවොත්, ස්වකීය ඒකජාතක පුත්‍රයාණන්වුවද ලොවට දෙවා වදළසේක. එසේ කෙළේ, උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනාම විනාශ නොවී සදතන ජීවනය ලබන පිණිස ය.යොහන් 3:16

දේශයන් උදෙසා විශාල දේ දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

අප තුළ ක්‍රියාකරනබලය කරණකොටගෙන අප ඉල්ලන, සිතන සියලු දේට වඩා අධිකලෙස කරන්නට බලය ඇති එපීස 3:20

අපට එසේ කළ හැකි සමහර ආකාර දැනගැනීම පිණිස මෙම කාඩ් පතේ අනේක් පිට හරවන්න දේශයන් උදෙසා **ඉල්ලන්න, සොයන්න** සහ **තට්ටු කරන්න.**

ඉල්ලීම දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ පැමිණීමට මඟ පාදයි
දේශයන් උදෙසා ඉල්ලන්නේ.....සොයන්නේ.....තට්ටු කරන්නේ කෙසේද

විවිධ දේශයන් උදෙසා යාච්ඤා කරන පිණිස **විශේෂිත බයිබල් පද දෙන ලෙසට** දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. ගීතාවලිය 119:130

ප්‍රවෘත්ති නරඹා ශීර්ෂපාඨ වල සඳහන් කරන දේශයන් උදෙසා යාච්ඤා කරන්න. 1 ලේකම් 12:32

සම්බන්ධතා රේඛා අනුගමනය කරන්න. යම් දේශයක ජීවත්වන හෝ සේවය කරන මිතුරන් ඔබට සිටී නම් ඔවුන් වෙනුවෙන් සහ එම දේශය වෙනුවෙන් යාච්ඤා කරන්න පටන්ගන්න. එපීස 6:18-19

යම් කාලයකට යාච්ඤාව අවශ්‍ය වන විශේෂිත දේශයන් පිළිබඳ ඔබව ඒත්තු ගන්නා ලෙසට **දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න**. දානියෙල් 2:22

ශුභාරංචිය රැගෙන යන්නන් යවන ලෙසට, **ශුභාරංචිය අසා නැති පුද්ගල කණ්ඩායම්** ඉලක්ක කරගෙන දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. යෙසායා 45:22-23

දේශයන්ගේ විමුක්තිය උදෙසා **නිරාහාරව යාච්ඤා කරන්න.** යෙසායා 58:5

දැනුවත්ව සිටින්න. යම් දේශයක් පිළිබඳ ඔබට හැකි ඔනෑම විස්තරයක් සොයාගන්න. (සම්පත් ලැයිස්තුව www.ASKNetwork.net හි ලබාගත හැක) හිතෝපදේශ 2:1-6

අන් අයටත් ඔබ සමඟ එකතු වන ලෙසට ආරාධනා කර ඔබගේ දර්ශනය බෙදාගන්න. මතෙව් 18:19-20

ඔබ දේශයන් උදෙසා යාච්ඤා කරන අතර එම දේශය තුළ **මැදිහත්කරුවන් නඟා සිටුවන ලෙසත්,** සමහර විට එහි ASK Network ස්ථාපිත කරන ලෙසත් දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. ලූක් 10:2

සිතියම් මත යාච්ඤා කරමින්, ඔබ යාච්ඤා කරන අතර **ගායනා කරමින් නමස්කාර කරන්න.** උත්පත්ති 13:17

ස්වාමීන්වහන්සේගේ නාමයන් සහ දේශයන් පාලනය කිරන්නට උන්වහන්සේගේ අයිතිය **ප්‍රකාශ කරන්න.** 1 සාමුවෙල් 17:45 (නාමයන් ලැයිස්තුව www.ASKNetwork.net ලබාගත හැක)

යාච්ඤා කරන්නට, ප්‍රේම කරන්නට සහ ශුභාරංචිය බෙදාගන්නා පිණිස **දේශයන් වෙතට යන්නට** ලැබෙන පිණිස ඉල්ලා සිටිමින් යාච්ඤා කරන්න. මතෙව් 28:19

මිෂනාරි ගමන් යන අය වෙනුවෙන් යාච්ඤා කරන්නට කැපවෙන්න. එපීස 1:15-17

මිෂනාරි සේවය පිළිබඳ ඔබගේ දැක්ම පුළුල් කරන ලෙසට ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. එය සරලව තබාගන්න!

“දෙවියන්වහන්සේ සහ මිනිසා වෙනුවෙන් ඕනෑම කෙනෙකුට කළ හැකි ශ්‍රේෂ්ඨතම දෙය නම් යාච්ඤා කිරීමයි. එය එකම දේ නොවෙයි. නමුත් එය ප්‍රධානතම දෙයයි.” එස්. ඩී. ගෝර්ඩන්

දෙවියන් වහන්සේ මිනිසුන්ගේ තරාතිරම් නොබලන බව දැන් මට සැබැවින්ම පැහැදිලි ය. සියලු ජාතීන් අතර උන්වහන්සේ කෙරෙහි බිය ඇති, හරි දේ කරන තැනැත්තා උන්වහන්සේට ප්‍රියමනාපය. ක්‍රියා 10:34-35